# ලීෂ්මනායසිස් (Leishmaniasis)

ලීෂ්මනායසිස් යනු වැලි මැස්සා දෂ්ඨ කිරීමෙන් මිනිසාට වැළදෙන රෝගයකි.

වැලි මැස්සා උෂ්ණාධික කලාපවල වනාන්තර, ලෙන් හා ගුල් ආශ්‍රිතව ව්‍යාප්ත වන වැලි පැහැති මැස්සන් විශේෂයකි.

චර්ම ලීෂ්මනායසිස් (Cutaneous Leishmaniasis) රෝගය ශ්‍රී ලංකාවේ සුලබව දැකිය හැකි වර්ගයයි. මීට අමතරව කලාතුරකින් ශ්ලේෂ්මල පටල ආශ්‍රිතව (Mucocutaneous Leishmaniasis) හා ශරීරයේ අභ්‍යන්තර අවයව වලට බලපාන පරිදිද (Visceral Leishmaniasis) මෙම රෝගය ඇතිවිය හැක.

## (1) මෙහි රෝග ලක්ෂණ මොනවාද?

වැලි මැස්සා දෂ්ඨ කළ වහාම හෝ මාස ගණනකට පසුව හෝ රෝග ලක්ෂණ ඇතිවිය හැක. ප්‍රධාන වශයෙන් ශරීරය නිරාවරණය වන ප්‍රදේශයේ සමෙහි රතු පැහැති බිබිලක් ලෙස මතුවේ. සති කිහිපයකින් මැද තුවාලයක් සහිත ගැටිත්තක් බවට පත් වේ. මෙවැනි තුවාල එකක් හෝ කීපයක් දැකිය හැක.

## (2) රෝගය හඳුනා ගන්නේ කෙසේද?

බොහෝ විට චර්ම රෝග වෛද්‍යවරයෙකුට රෝගියා පරීක්ෂා කිරීමෙන් පමණක්ම රෝගය හඳුනාගත හැක. සමහර අවස්ථාවලදී සමේ පටක පරීක්ෂාවන් රෝග නිර්ණය සඳහා අවශ්‍ය විය හැක.

## (3) රෝගය සඳහා ප්‍රතිකාර කරන්නේ කෙසේද?

බොහෝවිට ප්‍රතිකාර කිසිවක් නොමැතිව රෝගය ස්වයං සුව වීමක් සිදු වේ.

සමහරවිට විරූපී කැළලක් ඇති විය හැක. මේ සඳහා මාස ගණනාවක් ගතවිය හැකි අතර මෙම කැළැල් අවම කිරීමට හා රෝගය පැතිරීම වළක්වාලීම සඳහා සෑම රෝගියෙකුටම ප්‍රතිකාර දෙනු ලැබේ.

ප්‍රතිකාර ක්‍රම නම්,

- ස්ටිබොග්ලුකොනේට් (Stibogluconate) එන්නත් ප්‍රතිකාරය සතිපතා දිගුකාලිනව ලබා දීම අවශ්‍ය වේ.

- ද්‍රව නයිට්‍රජන් ප්‍රතිකාරය (Liquid Nitrogen Cryotherapy)

- Radiofrequency තාප ප්‍රතිකාර ක්‍රමය

මෙම ක්‍රම වලට අමතරව වෙනත් එන්නත් හෝ ඖෂධ වර්ග චර්ම රෝග වෛද්‍යවරයා විසින් නිර්ණය කරනු ඇත.

## (4) රෝගය වලක්වා ගන්නේ කෙසේද?

- රෝගය වලක්වා ගැනීම සඳහා වැලි මැස්සාගේගේ බෝ වීම සහ ව්‍යාප්තිය පාලනය කිරීම

- ගෘහ ආශ්‍රිතව පිරිසිදු භාවය පවත්වා ගැනීම

- මැස්සන් දෂ්ඨ කිරීම වළක්වා ගැනීම

- කෘමි විකර්ෂණ ගල්වන ලද දැල්, ස්ප්‍රේ වර්ග භාවිතා කිරීම

- කෘමි විකර්ෂණ සම මත ආලේපනය කිරීම

- වැලි මැස්සා වඩාත් ක්‍රියාකාරී වන සන්ධ්‍යා කාලයේ සිට අලුයම් කාලය දක්වා එළිමහන් ක්‍රියාකාරකම් වලින් වැළකී සිටීම හා එම කාලය තුළ ශරීරය ආවරණය වන පරිදි දිගු කලිසම් හා අත්දිගු කමිස භාවිතා කිරීම